මහෙස්ත්‍රාත් අධිකරණය
1987
අනුරාධපුරය

# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

## 1987 අංක 2 දරන සංචාරක සංවර්ධන (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1987 ජනවාරි මස 22 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

1987 ජනවාරි මස 23 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය

මිළ : ශත 45 යි　　තැපැල් ගාස්තුව : ශත 75 යි

## 1987 අංක 2 දරන සංචාරක සංවර්ධන (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1987 ජනවාරි මස 22 වන දින.]

එල්. ඩී.—ඕ. 13/83.

**1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත 1987 අංක 2 දරන සංචාරක සංවර්ධන (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2.** 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනතේ II වන කොටසට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් කොටස මෙයින් එයි ඇතුළත් කරනු ලබන අතර ඒ කොටස ඒ පනතේ IIඅ වන කොටස වශයෙන් බලපවත්වනු ලැබේ :— 1968 අංක 14 දරන පනතෙහි IIඅ අලුත් කොටස ඇතුළත් කිරීම.

**'IIඅ කොටස**

**සංචාරක සංවර්ධන ප්‍රදේශ**

අමාත්‍යවරයා ගේ නියමයක් මගින් යම් ප්‍රදේශ සංචාරක සංවර්ධන ප්‍රදේශ වශයෙන් ප්‍රකාශයට පත් කිරීම හා ඒ නියමයේ බලපෑම.

**73අ.** (1) ජාතික නිවාඩු නිකේතනයක් සංයුක්ත වන ප්‍රදේශයක් නොවන යම් ප්‍රදේශයක සංචාරක යන්ට පහසුකම් සහ සේවාවන් සැපයීමේ කාර්යය සඳහා සැලසුම් කරන ලද්දා වූ සහ කර ගෙන යන ලද්දා වූ කටයුතු විධිමත් කිරීම සහ පාලනය කිරීම අවශ්‍ය යයි අමාත්‍යවරයාගේ මතය වන අවස්ථාවක, ඔහු විසින්, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් ඒ ප්‍රදේශය සංචාරක සංවර්ධන ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ කරන ලද සෑම නියමයක් මගින් ම, ප්‍රදේශය සංයුක්ත වන ඉඩම්වල හෝ එක් එක් ඉඩමේ සීමාවන් දැක්වෙන ප්‍රදේශය නිර්ණය විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් කරන ලද නියමයක් මගින් සංචාරක සංවර්ධන ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු ප්‍රදේශය හෝ යම් කොටසක් යම් පළාත් පාලන ආයතනයක පරිපාලන සීමා ඇතුළත පවතින්නේ නම්, පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව හැර, අමාත්‍යවරයා විසින් එවැනි කිසිම නියමයක් කරනු නොලැබිය යුතු ය.

එක් එක් සංචාරක සංවර්ධන ප්‍රදේශයට අදාළ මණ්ඩලයේ කටයුතු.

73ආ. එක් එක් සංචාරක සංවර්ධන ප්‍රදේශයට අදාළව—

(අ) ඒ සංවර්ධන ප්‍රදේශය ඇතුළත සංචාරක පහසුකම් සහ සේවා සංවර්ධනය කිරීම, ප්‍රවර්ධනය කිරීම, සැලසුම් කිරීම සහ ධෛර්යමත් කිරීම ; සහ

(ආ) ඒ සංවර්ධන ප්‍රදේශය ඇතුළත සංචාරක පහසුකම් සහ සේවා විධිමත් කිරීම, පාලනය කිරීම, පවත්වාගෙන යාම සහ මෙහෙය වීම

මණ්ඩලයේ කටයුතු විය යුතු ය.

නාගරික සංවර්ධන අධිකාරියේ සහ අදාළ පළාත් පාලන ආයතනයෙහි එකඟත්වය ඇතිව දෙන ලද මණ්ඩලයේ අනුමතය නොමැතිව සංචාරක සංවර්ධන ප්‍රදේශය ඇතුළත ගොඩනැගිලි ආදිය තැනීම, ඉදිකිරීම ආදිය තහනම් කිරීම.

73ඇ. (මෙහි මින් මතු "අදාළ දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයකින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන යම් දිනයක පටන්, යම් සංචාරක සංවර්ධන ප්‍රදේශයක් ඇතුළත සංචාරක පහසුකම් සහ සේවා කිසිවක් සැපයීමේ කාර්යය සඳහා—

(අ) යම් ගොඩනැගිල්ලක් හෝ ඉදිකිරීමක් තැනීම හෝ ගොඩනැංවීම ; හෝ

(ආ) දැනට පවත්නා යම් ගොඩනැගිල්ලක් හෝ ඉදිකිරීමක් නැවත ගොඩ නැංවීම, වෙනස් කිරීම හෝ පරිවර්තනය කිරීම ; හෝ

(ඇ) යම් ආයතනයක් හෝ ව්‍යාපාරයක් ඇති කිරීම සහ/හෝ කරගෙන යාම

ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන පනතින් පිහිටුවන ලද නාගරික සංවර්ධන අධිකාරියෙහි සහ අදාළ පළාත් පාලන ආයතනයෙහි එකඟත්වය ඇතිව දෙන ලද මණ්ඩලයේ අනුමතය නොමැතිව කිසිම තැනැත්තකු විසින් කරනු නොලැබිය යුතු ය.'.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා උසුව එළඹෙන එක් එක වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.